# එක්සත් ජාතික පක්ෂයේ දර්ශණය විය යුත්තේ කුමක්ද?

නීතිඥ ශිරාල් ලක්තිලක



- නූතන රාජ්‍ය පාලනය සිදු කරන ප්‍රධාන ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය වන්නේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයයි.
- නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය මඟින් මහජනතාවගේ පරමාධිපත්‍ය හා රාජ්‍ය පාලනය සම්බන්ධ කරනු ලබයි.
- මහජනතාවගේ පරමාධිපත්‍ය වන්නේ :

    1. මහජනතාවගේ නීති පැනවීමේ බලය
    2. මහජනතාවගේ නීති ක්‍රියාත්මක කිරීමේ බලය
    3. මහජනතාවගේ නීති අර්ථ නිරූපණය කිරීමේ බලය
    4. මහජනතාවගේ මානව අයිතිවාසිකම්
    5. මහජනතාවගේ ඡන්ද අයිතිය යන පස්වැදැරුම්

    අයිතිවාසිකම් වේ.
- මහජනතාවගේ පරමාධිපත්‍ය රාජ්‍ය පාලනයට සම්බන්ධ කරනු ලබන්නේ සමාජ සම්මුති න්‍යාය මඟිනි.

- සමාජ සම්මුති න්‍යාය, 17 වන සියවසේ පැවැති පුනර්ජීවන යුගයේදී ඉදිරිපත් කරනු ලැබු දාර්ශනිකයන් තිදෙනකු වූහ.

1. ජෝන් ලොක්
2. හොබ්ස්
3. ජීන් රූසෝ යන අයවලුන්ය.

- සමාජ සම්මුතිය මඟින් කියවෙන්නේ මහජනතාව විසින් තමන් පාලනය කිරීම සඳහා මහජන නියෝජිතයින්ගේන් සමන්විත රාජ්‍ය යන ඒකකය ගොඩනඟා ගත් ආකාරයයි. එහිදී මහජනතාව තම අධිපත්‍යය බලයක් වන ඡන්ද අයිතිය භාවිතා කොට, තමන්ගේ සිතැඟි පරිදි මහජන නියෝජිතයන් වෙත, තමන් වෙසෙන භූමිය පාලනය කරළීම සඳහා, තමන් සතුවූ පරමාධිපත්‍ය බලතල තුනක්, එනම්
  - නීති සෑදීමේ බලය
  - නීති ක්‍රියාත්මක කිරීමේ බලය හා
  - නීති අර්ථ නිරූපණය කිරීමේ බලතල ලබාදේ.
- එසේ ලබා දෙන්නේ යම් කාල වකවානුවකට වන අතර එකී කාලවකවානුව තුල මහජනතාවගේ මානව හිමිකම් ආරක්ෂා කිරීමේ බලය රජය සතුවේ.

- ඒ ආකාරයට ගොඩනඟනු ලබන රජයේ මූලික අවයව වන්නේ,

   1. ව්‍යවස්ථාදායකය
   2. විධායකය
   3. අධිකරණය යන්නයි.

- මේ ආකාරයට ගොඩනැගෙන රාජ්‍ය කළමණාකරණය කරනු ලබන්නේ මහජනතාවගේ ඡන්දයෙන් තෝරා පත් කරනුලබන මහජන නියෝජිතයන් ගෙන් වන අතර, මහජන නියෝජිතයන් ඉදිරිපත් කරනු ලබන්නේ දේශපාලන පක්ෂ මඟිනි.

- දේශපාලන පක්ෂ සඳහා ඒ් අනුව, රාජ්‍ය පාලනය කිරීම සඳහා දෘෂ්ඨියක් / මතවාදයක් පවතින අතර, මහජනතාව එසේ තම මහජන නියෝජිතයින් පක්ෂ අතරින් තෝරා පත් කරගනු ලබන්නේ රාජ්‍ය පාලනයකට වඩාත් ගැළපෙන දෘෂ්ඨිවාදය / මතවාදය මඟින් ගොඩනඟනු ලබන සංවර්ධන මාදිලිය සලකා බලාය.

- නූතන ලෝකයේ රාජ්‍ය පාලනය සඳහා ඉදිරිපත් වී ඇති දෘෂ්ඨිවාදයන් කිහිපයක් වේ.

    1. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය
    2. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය
    3. මාක්ස්වාදය

- මේ හැරුනු කොට මෙකී දෘෂ්ඨිවාදයන්ට සමාන්තරව යම් පිළිගැනීමක් ලැබී ඇති දෘෂ්ඨිවාදයන් අතරට,

    1. පරිසරවාදය
    2. කාන්තාවාදය
    3. පශ්චාත් නූතනවාදය / ව්‍යුහයවාදය වැදගත්වේ.

# ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්ද ?

- ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව සාකච්ඡා කිරිමේදී ඒ තුළ ප්‍රධාන අංග ගනනාවක් අන්තර්ගතවේ.
  1. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථිකය
  2. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම්

- ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි ආර්ථිකය පිළිබඳව කරන සාකච්ඡාවකදී ඉදිරියට පැමිනෙන ප්‍රධාන දාර්ශනිකයන් වන්නේඃ
  1. ඇඩම්ස් ස්මිත්
  2. ඩෙවිඩ් රිකාඩෝ
  3. ජෝන් ස්ටුවර්ට් මිල් වන්නවවුන්ය.

# ඇඩම් ස්මිත්ගේ මතය

1. ඕනෑම සමාජයක ප්‍රධාන අවශ්‍යතාවය වන්නේ පුද්ගලයාගේ සංතෘෂ්ඨිය (Happiness) එය භුක්ති විඳීමට තිබෙන අවස්ථා (Opportunities)

2. රජයක ප්‍රධාන වගකීම වන්නේ එකී අවස්ථා ඇති කිරීමයි.

3. එවිට එකී අවස්ථා පුද්ගලයන් විසින් භාවිතා කොට තම පැවැත්ම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරනු ලබයි.

- රටක ආර්ථිකය ගොඩ නැගෙන්නේ මේ ආකාරයට නිපදවෙන භාණ්ඩ හා සේවා ඉල්ලුම හා සැපයුම මත මිලක් තීරණය වී හුවමාරු වීම තුලිනි.

# ඩෙවිඩ් රිකාඩෝගේ මතය

- ඩෙවිඩ් රිකාඩෝ, ඇඩම්ස් ස්මිත් ඉහත කී මතය තුළ පැන නැගෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සූත්‍ර ගත කළේය.

ඔහුට අනුව:

- පුද්ගලයන් නිෂ්පාදන ක්‍රියාවලියක නිරතවන්නේ ආර්ථික සාධක (ශ්‍රමය, දේපළ, ප්‍රාග්ධනය) භාවිත කොට පූර්ණ වාසියක් ලබා ගැනීමට බවයි. මෙකී පූර්ණ වාසිය වෙළඳපළ තුළදී සාපේක්ෂ වාසියක් බවට පත් වන බව කිවේය. මෙකී සාපේක්ෂ වාසිය පදනම් වන්නේ භාවිතා කිරීමට රටකට හෝ පුද්ගලයන්ට ඇති හැකියාව මත බව ඔහු අවධාරණය කොට සිටියේය.

# ජෝන් ස්ටුවර්ට මිල් ගේ මතය:

- නිදහස් වෙළඳාම හා නිර්බාධිත රාජ්‍ය (Äissez - faire state) අතර සම්බන්ධය හුවා දැක්වූ මිල්, රාජ්‍යයක් මූලික වගකීම වන්නේ බාහිර බලවේගයන්ගෙන් රට ආරක්ෂා කිරීම හා රට තුළ අභ්‍යන්තර සාමය පවත්වා ගෙන යාම බවයි. රට තුළ කෙරෙන අනෙක් සියලු දෑ නිදහස් වෙළඳාපළ මඟින් සිදුවිය යුතු බව සඳහන් කළේය.

- මෙම මතය නිර්භාධිත ධනේෂවර ක්‍රමය ලෙස පසුව ප්‍රචලිත විය.

# ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම්

- මේ තුළින් ඉදිරිපත් කරනු ලබන්නේ, පුද්ගල නිදහස මත පදනම් වූ එකිනෙකාට වූ තෝරා ගැනීමේ නිදහස (Freedom of Chioce) බලපෑම් වලට යටත් නොවීමට පුද්ගලයකු සතු අයිතිය (Freedom from Interfeernce)
- ඒ අනුව රාජ්‍යයක් මූලික වගකීම වන්නේ ඉහත කී පුද්ගල අයිතිවාසිකම් හා නිදහස ආරක්ෂා කිරීමයි.
- ජෝන් ලොක්, මොන්ටෙස්කු, කාන්ට්, බර්බට් ස්පෙන්සර් මෙම මූල ධර්මයන් ඉදිරියට ගෙන ආ මූලික දාර්ශනිකයන් වූහ.

# මාක්ස්වාදය

- මාක්ස්වාදයේ පුරෝගාමීන් වන්නේ මාක්ස් සහ එංගල්ස් වන අතර, පසුව ලෙනින් එම දර්ශනයට ප්‍රයෝගිකත්ව එක් කරන ලද්දේය.

# මාක්ස්වාදය ප්‍රධාන සංරචක තුනකින් සමන්විත වේ.

1. දෛලෙක්තික භෞතිකවාදය

- එනම්, ප්‍රමාණාත්මක දේ ගුණාත්මක වන ක්‍රියාවලියක් පවතින බව එම ක්‍රියාලිය හට ගන්නේ ප්‍රතිවිරුද්ධ අන්තයන්ගේ ගැටීම තුළින් බව,
- එකී ක්‍රියාවලිය සිදුවන්නේ ඕපාතිකව නොව පෙර තිබු දේ තුළින් ආභාෂය ලබා ගෙන බව එනම් අභාවයාගේ අභාවය යන තුන් ගුනය අවධාරණය කළේය.

2. ඉතිහාසය ගොඩ නැගෙන්නේ දෛලික්තික භෞතිකවාදී ඉතිහාස ප්‍රගමනයක් තුළින් බව,

- එහිදී ඕනෑම සමාජයක් අධෝව්‍යුහයක් හා උපරිව්‍යුහයක් මඟින් හඳුනාගත හැකි බව,
- එහිදී අධෝව්‍යුහය වන්නේ ආර්ථිකය බවත්, උපරිව්‍යුහය වන්නේ එකී ආර්ථිකය මඟින් ගොඩ නඟනු ලබන සියලු දෑ බවත්ය. විද්‍යාව, දේශපාලනය, සංස්කෘතිය යනාදිය.

3. රටක ආර්ථිකය ගොඩනඟනු ලබන්නේ ඉල්ලුම හා සැපයුම මත තීරණය වන මීල ක්‍රමය හා ශ්‍රමය මත පදනම් වන නිෂ්පාදන ක්‍රමය හා ශ්‍රමයේ අතිරික්තිය මත ලාභය ගොඩනැඟීම තුළය.

මාක්ස්වාදය, ලිබරල් ධනේෂ්වර ක්‍රමය තුළ අර්බුදයක් පවතින බව පෙන්වා දෙමින්, එකී අර්බුදයයක් පවතින බව පෙන්වා දෙමින්, එකී අර්බදය තුළ සිදුවන විප්ලවයක් මඟින් මාක්සාවාදී සමාජයක් බිහිවන බව තර්ක කළේය.

**ඒ සඳහා වූ මාක්ස්වාදී තර්කය වුයේ.**

1. ඉල්ලුම හා සැපයුම මඟින් මිල තීරණය කිරීමේදී නිපදවන සැපැයුම් තරඟකාරිත්වය නිෂ්පාදනයේ ලාභය අවම කරයි.

2. මේ ආකාරයට ඇතිවන ලාභයේ අවම වීම තුළ ආර්ථිකයේ එකතැන පල්වීමක් ඇති කරයි.

3. මෙසේ එකතැන පල්වෙන ආර්ථිකය, ධනේෂ්වර අර්ථ ක්‍රමයේ අර්බුදයක් ඇති කරන අතර, ඒ මත නිර්ධන පංතික විප්ලවය ඇති කරනු ලබයි.

# සමාජ ප්‍රජාතන්ත්‍රවාදය

- සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ආරම්භ වන්නේ සමාජවාදී සංකල්පය තුළ වන අතර, අවසානයේදී එකී මතය, සමාජමය න්‍යාය පත්‍රයේදී වාමාංශික වූ අතර, ආර්ථිකමය න්‍යාය පත්‍රය තුළ දක්ෂිනාංශික වුහ. ඒ අනුව Social Market Economy යන සංකල්පය ඉදිරියට පැමිණ අතර එහිදී නිදහස, යුක්තිය හා සහෝදරත්වය (Liberty" Justice and Solidarity) යන ප්‍රවිශ්ඨය තුළ ඉහත කී සමාජ වෙළඳපළ ආර්ථිකය ගොඩනැගීමට කටයුතු කරයි.

- මාක්ස් ධනේෂ්වර ක්‍රමයේ අර්බුදය හඳුනා ගත්තාක් මෙන්ම ජෝන් ස්ටවුර්ට් මිල් වැනි ලිබරල් දාර්ශනිකයන්ද තරඟය තුළ ලාභය අඩවීම පිළිබඳ අවස්ථාව හඳුනා ගත්තේය.

- ඒ නිසාම ධනේෂ්වර ආර්ථික දේශපාලනය වරින් වර ඒ සඳහා ප්‍රතිකර්ම සොයා ගත්තේය. එහිදී ප්‍රථම උත්සාහ වුයේ අධිරාජ්‍යවාදයයි.

- අධිරාජ්‍යවාදය ගොඩනැඟීම යනුවෙන් අදහස් වුයේ තම අඩු වන ලාභය වැඩි කර ගැනීම සඳහා අඩු මිලට අමු ද්‍රව්‍ය සොයා යාමයි ඒ තුළින් තම ධනේෂ්වර අර්ථ ක්‍රමය ස්ථාවර කරගත්තා.

දෙවන උත්සාය වුයේ තාක්ෂණයයි. විද්‍යාව මඟින් ගොඩනඟන තාක්ෂණය මඟින්, නිෂ්පාදන ක්‍රියාවලියේ පිරිවැය බරපතල ලෙස පියවීමට හැකි වූ අතර, එමඟින් ස්ථාවර ගෝලීය උතුරක් හා අස්ථාවර ගෝලීය දකුණක් බිහි කරීමට අධිරාජ්‍යවාදය නිමවීමෙන් පසු හැකි වූයේය. ඒ තුළ අද සාකච්ඡා කරන නව යටත් විජිතවාදය වැනි සංකල්ප බිහිවු අතර, ගෝලීය දකුණ පරිවාරය වූ අතර, ගෝලීය උතුර කේන්ද්‍රය වුයේය. ඒ තුළ පරිවාරය විසින් කෙන්ද්‍රය වෙත ලාභදායී අමුද්‍රව්‍ය සපයන්නටත්, කේන්ද්‍රය මත පිරවාරය යැපෙන්නටත් ඉඩ සලසා තිබුණි.

- තුන්වන උත්සාහය, අධිරාජ්‍යවාදයේ සහ නව යටත් විජිතකරණයේ බිඳ වැටීම තුළ ගොඩනැඟුනේ

## නව ලිබරල් අර්ථ ක්‍රමයයි

- එහි මූලික අංග ලක්‍ෂණ වූයේ

  1. විවෘත වෙළඳපළ පිළිගැනීම
  2. අර්ථිකයේ නිර්භාධකරණය
  3. පෞද්ගලිකකරණය
  4. පොදු යහපත හා පොදු සුභසාධනය වෙනුවට පුද්ගල අවශ්‍යතා තෘප්ත කෙරෙන සංවර්ධන ප්‍රවිශ්ඨය
  5. පුද්ගලයා හා පාරිභෝගිකයා හා බැඳුණු අයිතිවාසිකම්

- ඉහත කී  නව ලිබරල් අර්ථ ක්‍රමය (Neo Liberal Economics Policies) හඳුන්වා දෙනු ලබුයේ 80 දශකයේ රොනල්ඩ් රේගන් හා මාග්‍රට් දැතර් යන අයවලුන්ගේ ප්‍රධානත්වයෙන් වන අතර, මෙකී ප්‍රතිපත්ති රාමුව වොෂින්ටන් සම්මුතිය (Washinton Consensus) ලෙස හඳුන්වනු ලබයි.

- කෙසේ නමුත් මෙකී වොෂින්ටන් සම්මුති දශකයක් පුරා ක්‍රියාත්මක වීමෙන් පසුව, සිදු කළ පසු විපරමකින් පසුව ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්ව නව වොෂින්ටන් සම්මුතිය නැමැති. ලියැවිල්ලක් එළිදක්වා තිබේ. වර්තමානයට අදාළ වන්නේ මෙකී ප්‍රතිපත්තියයි.

# ස්තුතියි